නාගරික සංවර්ධන අධිකාරිය

# තිරසර පුරවර

ත්‍රෛමාසික පුවත් සඟරාව

01 වෙළුම | 2017 අප්‍රේල් - ජුනි කලාපය

## ප්‍රධාන පුවත්

### විශ්වීය බොදු වදන ලොවට රැගෙන ගිය දියවන්නා වෙසක් කලාපය - ජාත්‍යන්තර වෙසක් දිනය 2017



ජාත්‍යන්තර වෙසක් දින සමරන්නට මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය හා කඨානායක කාර්යාලය එක්ව සුවිශේෂී වෙසක් කලාපයක් දියවන්නාව ආශ්‍රිතව ඉතා සාර්ථක ලෙස ක්‍රියාත්මක විය.

ආසියානු රටවල් දහයක බෞද්ධ සම්ප්‍රදායන් මෙවර දියවන්නා වෙසක් කලාපයේදී එළි දැක්වීම සුවිශේෂීම කාර්යය විය. ඉන්දියාව, පකිස්ථානය, රුසියාව, මියන්මාරය, නේපාලය, චීනය, තායිලන්තය, බුරුමය හා සිංගප්පූරුව ආදී රටවල් ඔවුන්ට ආවේණික වූ වෙසක් සැරසිලි, ආගමික සම්ප්‍රදායන් මෙරට බෞද්ධ ජනතාවට දැකබලා සිත් පහන් කරන්නට ප්‍රදර්ශනය කෙරිණි.

### පොල්දූව නව අතුරු මාර්ගය අදියර 1 අවසන් අදියරට



නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2015 වර්ෂයේ ඔක්තෝබර් මස 31 දින ආරම්භ කරන ලද පොල්දුව නව අතුරු මාර්ගය අදියර 1 මේ වනවිට අවසන් අදියරට පැමිණ තිබෙන අතර

........................4 වැනි පිටුවට

## විධිමත් ලෙස කසළ කළමනාකරණය ජනතාවගේ වගකීමයි.

ගොඩනැගිලි අනුමත කර ගැනීමේදී එම ගොඩනැගිල්ල සඳහා නිසි කසළ කළමනාකරණ ක්‍රියාවලියක් තිබිය යුතුයි

- අමාත්‍ය
පාඨලී චම්පික රණවක



**අමාත්‍යතුමන් මෙම අදහස් පළ කර සිටියේ මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරන නිකසළ පුරවර මහල් නිවාසවල ජනනය වන ඝන අපද්‍රව්‍ය විධිමත් පරිදි කළමනාකරණය පහසුකරලීම සඳහා තිරසාර විසඳුමක් ලබාදීමේ අරමුණින් ක්‍රියාත්මක වන වැඩසටහනේ සමාරම්භක අවස්ථාවට එක් වෙමිනි. මෙම උත්සවය ජුනි 16 දින බත්තරමුල්ල, සුහුරුපායේ 19 වන මහලේ පිහිටි ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.**

එහිදී අමාත්‍යවරයා දැක්වූ අදහස්,‘‘මේ රටේ මහජනයට වගකීමක් තිබිය යුතුයි තමන්ගේ කසළ අඩු තරමේ වෙන් කරලවත් පළාත් පාලන ආයතන වෙත භාරදීමට. ඒ වගකීම ඉටුකරන්නෙ නැතිව පාරට කුණු දමනවා. ඒ කුණු ගොඩවල්වල ඡායාරූප මාධ්‍ය වෙත නිකුත් කරනවා. අණ්ඩුවට කුණු ටිකවත් එකතු කර ගන්න බැහැ කියා මතයක් ගොඩනගනවා. කුණු දාන්න යන තැන්වල විරෝධය පානවා. ඔය ටික තමයි අපට සමාජයේ දැක ගන්න පුළුවන් තත්වය. කසළ ගැන කියනවා නම් අපේ අමාත්‍යාංශයට කිසිම වගකීමක් නැහැ. නමුත් මේ කසළවලින් වැඩිම පීඩා විඳින අමාත්‍යාංශය අපේ අමාත්‍යාංශය. අපේ නාගරික සංවර්ධන අධිකාරියට, ඉඩම් සංවර්ධන සංස්ථාවට අයත් වටිනා ඉඩම්, පළාත් සභාවත් ඒ වගේම නාගරික ආයතනත් විනාශ කරමින් තිබෙනවා. කසළ දමමින්. හැබැයි ජනමාධ්‍ය ඉදිරියේ වීරයෝවගේ කතා පවත්නවා. මේවා අපට දුන්නනම් විසඳනවා කියා, එක පුවත්පතක පළවුණා මීතොටමුල්ලේ කසළ එංගලන්තෙට ගෙනියන්න හැදුවා මෙගාපොලිස් හරස් උනා කියලා. එංගලන්තෙට එක කුණු කිලෝවක් රැගෙන ගොස් පෙන්නුවොත් ඔය පත්තර අයිතිකාරයයි, එය ප්‍රකාශ කළ අයයි, මම මේ ධූරයෙන් හෙට ගෙදර යනවා. අමූලික බොරු පතුරුවනවා මේ වගකීම පැහැර හැරලා. දශක දෙකක් මේ ප්‍රශ්නය විසඳගන්න, විධිමත් පිළියමකට වැඩකරන්න පළාත් සභාවත් කොළඹ නගර සභාවත්, ඒ අදාල ආයතනත් සමත් වෙලා නැහැ. ඔවුන්ගේ තමයි මේ වගකීම. අපි මේ ඉටු කරන්න යන්නේ අපට සමාජමය පැත්තෙන් පැවරිලා තිබෙන වගකීමක්. එසේම අපි අපේ තැන්වලට හෙට කසළ දමන එක නතර කළහොත් ඔය පණ්ඩිත කතා, වීරකතා පවත්වන කිසි කෙනෙකුට බිම් අඟලක් නැහැ ඒ කසළ ටික ගෙනිහින් දමන්න. එම නිසා අපි එවැනි අර්බුද කරා යොමුවන්නේ නැහැ. අපි වගකීමෙන් ක්‍රියාකරනවා.

> “ මේ රටේ මහජනයාට වගකීමක් තිබිය යුතුයි තමන්ගේ කසළ අඩු තරමේ වෙන් කරලවත් පළාත් පාලන ආයතන වෙත භාරදීමට. ”

මීතොටමුල්ලේ ඛේදවාචකයට වගකිව යුතු අයට හරිනම් මරණීය දණ්ඩනය ලබාදිය යුතුයි. කොළඹ නගර සභාවත්, එය පාලනය කරන පළාත් සභාවත් එයට වගකිව යුතුයි. අවස්ථා හතරකදි දැනුම් දුන්නා එතනට කුණු දමන්න එපා කියලා. එය දිගටම කරගෙන ගියා එතැන විශාල ජාවාරමක් සිදු වූ නිසා. එතනට කොළඹ නගරයේ කසළ විතරක් නෙමෙයි පිටපළාත්වල කුණුත් ගෙනත් දැම්මා. අද ඇයි කඩුවෙල කුණු දමන්න තැනක් නැත්තේ. ඇයි කොලොන්නාවේ, වත්තල කුණු දමන්න තැනක් නැත්තේ. රු.8,000 ට්‍රැක්ටර් ලෝඩ් එකකට මුදල් අරගෙන රු.2,000 ට මීතොටමුල්ල ඇතෑරියා. අක්කර 21 ක වටිනා නාගරික ඉඩමක් විනාශ කළා.

........................2 වැනි පිටුවට



මුදල් හා ජන මාධ්‍ය නියෝජ්‍ය අමාත්‍ය ධුරයෙන් පිදුම් ලැබූ මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මැතිතුමන්ට අපගේ සුභාශිංසන

## අපගේ දැක්ම

**ජීවිතයේ ගුණාත්මකභාවය සහ ජීවිතයේ ඵලදායිතාවය ඉහළ නංවන තිරසාර නාගරික මධ්‍යස්ථානයන්හි ප්‍රධාන සැලසුම්කරු සහ සංවර්ධන වීම මගින් ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධන අභිලාෂයන් අභිවර්ධනය කිරීම.**

## අපගේ මෙහෙවර

**මූල්‍යමය ස්වාධීන සහ ගෝලීයව අගය කරනු ලබන පරිපූර්ණ, තිරසාර නාගරික මධ්‍යස්ථානයන්හි නිර්මාපකයාගේ තත්වය සාක්ෂාත් කරගැනීමේ අරමුණින් සංවර්ධන සැලසුම් සකස් කිරීම සහ සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නියාමනය කිරීම.**



# නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති ආචාර්ය ජගත් මුණසිංහ මහතා



අධිකාරියේ දැක්ම ලෙස අප අභිනවයෙන් හඳුන්වාදුන් "සුසැදි, සුරැකි සොඳුරු නගරයක්" යන තේමා පාඨය මෙම අපේක්ෂාව පිළිබඳ පුළුල් අර්ථයක් සපයන බව මාගේ විශ්වාසයයි. සුසැදි යන්නෙන් අදහස් වන්නේ සැලසුම් ගත සංවර්ධනයක් ලෙසත්, සුරැකි යනුවෙන් අදහස් කරනුයේ හඳුන්වා දෙනු ලැබූ සංවර්ධන ව්‍යාපෘතිය ආර්ථික සහ සාමාජීය වශයෙන් චිරස්ථායීවීමත්, සොඳුරු යන්නෙන් ජීවත්වන්නන්ට සෞම්‍ය සහ හිතකර ජීවන වටපිටාවක් හිමිකරදීමේ අභිමතාර්ථයයි. ඒ අනුව, නාගරික සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන ප්‍රදේශ සංවර්ධනය කිරීමේ නියමු ආයතනය වන අතර, එම දැක්ම නිසියාකාරව අවබෝධ කරගෙන කටයුතු මෙහෙයවීම අපගේ අපේක්ෂිත ඉලක්කයයි.

1978 නාගරික සංවර්ධනය අධිකාරීයේ පනත අනුව ස්ථාපිත නාගරික සංවර්ධන අධිකාරියට ප්‍රධාන කාර්ය්‍ය භාරයන් 3ක් පැවරී ඇත. එයින් පළමුවැන්න නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කරනු ලබන නාගරික සංවර්ධන ප්‍රදේශ සඳහා ඒකාබද්ධ සංවර්ධන සැලසුම් සකස් කිරීමයි. මේ වන විට ශ්‍රී ලංකාව පුරා නාගරික ප්‍රදේශ 240 කට වැඩි ගණනක් ප්‍රකාශයට පත් කර තිබුනත් නගර නිර්මාණ සැලසුම් සකස් කොට ඇත්තේ එයින් 40ක් සඳහා පමණි. එයිනුත් සමහරක් සංවර්ධන සැලසුම් අවුරුදු 10කට වඩා පැරණි බැවින් යාවත්කාලීන කිරීම අත්‍යවශ්‍ය වී ඇත. එසේම මෙම බොහොමයක් සැලසුම් වර්තමාන සංවර්ධන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි විද්‍යාත්මක පුරෝකථනයක් සහිතව සැකසී නොමැති බැවින් ගැටළු රාශියක් එම නගර ආශ්‍රිතව පැන නැගී ඇත. මෙම තත්වය මඟ හැරීම සඳහා 2020 වන විට ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රකාශිත නගර සංවර්ධන ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීමේ වැඩ පිළිවෙලක් දැන් ඇරඹී ඇත. ඒ අනුව මුලු දිවයිනම කොටස් 44කට බෙදා ඒ එක් එක් කොටසට ඇතුළත්වෙන නගර සඳහා අවම වශයෙන් අවුරුද්දකට එක් සැලසුමක් සකස් කිරීමට විශේෂඥ, මානව සහ අනෙකුත් සම්පත් මෙහෙයවා ඇත. ඒ අනුව ආරම්භයක් වශයෙන් මෙම වසර අවසන් වන විට ප්‍රදේශ 44ක් සඳහා සංවර්ධන සැලසුම් නිමා කිරීමේ කටයුත්ත දැන් සිදු කෙරෙමින් පවති.

නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරෙන දෙවන ප්‍රධාන වගකීම වන්නේ ශ්‍රී ලංකාව පුරා මනාව සැකසුණු භෞතික පරිසරයක් ලඟා කර ගැනිම පිණිස සියලු ඉදිකිරීම් හා අනෙකුත් සංවර්ධන කාර්යභාරයන් නියාමනය කිරීමටත් ඒ සඳහා පහසුකම් සැපයීමත්ය. මෙම කාර්යය පසුගිය අවුරුදු ගණනාවක් පුරා අදාළ පළාත් පාලන ආයතන වෙත පවරා විමධ්‍යගත කර තිබුණත් එහිදි අනුගමනය කෙරෙන යල් පැනගිය ක්‍රමවේදයන් හා ඒ හා බැඳුනු අකාර්යක්ෂම හා නොයෙකුත් අක්‍රමිකතාවලට මඟ පෑදීමක්ද දැකිය හැකිවිය. මේ ගැන කටයුතු කිරීම සඳහා මෙම වසරේ පෙබරවාරි මස සිට ශ්‍රී ලංකාවේ නගරවල භෞතික පරිසරයට තීරණාත්මක බලපෑම් කළ හැකි සංවර්ධන කටයුතු නියාමනය නැවතත් නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ගනු ලැබීය. මේ වන විට එම තෝරාගත් වර්ගයේ සංවර්ධන කටයුතු සඳහා ලොව ඕනෑම තැනක සිට බලපත්‍රයක් අයදුම් කිරීමට අන්තර්ජාලය ඔස්සේ නවීන තාක්ෂණය භාවිතා කිරීමේ පහසුකම් සැලසී ඇත. ඒ අනුව වඩාත් නවීන, කාර්යක්ෂම සහ විශ්වාසනීය සේවයක් සඳහා මෙම අධිකාරියට මඟ පෑදී ඇත. ඕනෑම අයදුම් පත්‍රයකට අවශ්‍ය කරන සියළු තොරතුරු නිවැරදිව සපයා ඇත්නම් සති 3-4 කාලයක් ඇතුළත අදාළ අනුමැතිය ලබාගැනීමට හැකිය. තවද, ඉතා කෙටි කලකදී ඉදිකිරීම් වලට අදාළ සවිස්තරාත්ම සිතුවම් (detail drawings) පවා වෙබ් අඩවිය මගින් අධිකාරිය වෙත ලබාදීමට කටයුතු සැපයෙනවා ඇත. එසේම කිසියම් ප්‍රමාදයක් සිදුවී ඇත්නම් අයදුම්කරුට එම අයදුම්පත කුමන හේතුවක් නිසා පමා වන්නේදැයි වෙබ් අඩවිය මඟින් දැන ගැනීමට හැකිය.

මෙම කටයුත්ත සාර්ථකව සිදු කිරීම සඳහා එක් එක් ප්‍රදේශයට ස්ථානගත කරන ලද බලාත්මක නිලධාරියෙක් පත් කොට ඇත.

අධිකාරියට පැවරෙන තුන්වන ප්‍රධාන කාර්යය වන්නේ ශ්‍රී ලංකාව පුරා නාගරික සංවර්ධනය උදෙසා වැදගත්වන ව්‍යාපෘති නිර්මාණය කිරීම හා ඒවා ක්‍රියාත්මක කොට කළමානාකරණය කිරීමය. පසුගිය වකවානුව පුරා නගරවල ඉදිවුණු බොහොමයක් වෙළඳ සංකීර්ණ, බස් නැවතුම්පලවල් හා අනෙකුත් පහසුකම් ශක්‍යතා අධ්‍යනයකින් තොරව හා වඩා හොඳ වෙළඳපළක් අරමුණ කොටගෙන සිදුවුණු බවක් නොපෙනේ. උදාහරණයක් ලෙස ක්‍රමානුකූලව බස් නැවතුම්පල ඉදිකර ඇතත්, ඒ ස්ථානවල උඩු මහළ වෙළඳ කටයුතු සඳහා හිතකර වන අන්දමින් සැකසී නොතිබීම මත එයින් අපේක්ෂිත ආර්ථික හා සමාජීය ප්‍රතිඵල ලබාගැනිමේ ගැටළුවක් පවතී. මේ නිසා මින් පසු සිදුවෙන එබඳු සංවර්ධන ව්‍යාපෘති වාස්තු විද්‍යාත්මකව හා ආර්ථික සමතුලිතතාවය සහ සමාජ සංවර්ධනයට සුදුසු වන පරිදි ශක්‍යතා අධ්‍යනයක් සහිතව නිසි මාර්ගෝපදේශයක් ඇතිව නිර්මාණය කිරීම අධිකාරියේ බලාපොරොත්තු වේ.

මීට අමතරව නාගරික සංවර්ධන අධිකාරියේ උපදේශක සේවා අංශය සහ පර්යේෂණ හා නිර්මාණකරණ අංශයන් වඩාත් ශක්තිමත් කොට අනාගතයට සරිලන විධිමත් සැලසුම්, නියාමන ක්‍රමවේදයන් හා භෞතික සැලසුම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මෙම අධිකාරිය ක්‍රමානුකූලව ප්‍රතිව්‍යුහගත කිරීම දැන් ඇරඹී ඇත.

.........................**4 වැනි පිටුවට**

# විධිමත් ලෙස කසළ කළමනාකරණය ජනතාවගේ වගකීමයි...

..............................1 වැනි පිටුවෙන්

මතක තබා ගන්න ගෝල්ෆේස් පිටිටනියේ ප්‍රමාණය අක්කර 18 යි. මීතොටමුල්ල අක්කර 21 යි. කොච්චර විශාල ඉඩමක් ද කියලා බලන්න මේ විනාශ කර තිබෙන්නේ. මිලියන 1500 කට වැඩි ප්‍රමාණයක් වටින ඉඩමක් තමයි මේ නගර සභාවෙන් නාස්ති කර දැම්මේ. ඒ නිසා මේ ක්‍රියාවලිය නතර විය යුතුයි. තැන තැන කුණු දදා මේ කොළඹ විතරක් ලස්සනට තියාගෙන, කොළඹ නගරයේ අවලස්සන කුණු තෙත්බිම්වල වගුරු බිම්වල දමන යුගය අපි අවසන් කළ යුතුයි. එතනදී මේ පුරවැසියන්ට විශේෂයෙන්ම මේ නාගරික මහල් නිවාසවල අයට දරුණු සමාජ වගකීමක් තිබෙනවා. ඒ සමාජ වගකීම ඔබත් එක්ක ඉටු කරන්නයි අද අපි මේ හමුව කැදෙව්වේ. අපි හැමෝම ජීවත්වන කාලය තුළ කසළ නිර්මාණය කරනවා. මෙයට දශක දෙකකට, තුනකට කලින් නිර්මාණය කළ කසළවලට වඩා සංකීර්ණ කසළ ප්‍රමාණයක් අද අපි නිර්මාණය කරනවා. අද අපේ ආහාර දවටනවල දවටා තමයි අප භාවිත කරන්නේ. වෙනත් භාණ්ඩ හා සේවා ගොඩක් පරිභෝජනය කරනවා. ඇත්තටම අද කොළඹ නගරයේ අද සමානා ජීවිතයක් ගත කරන කෙනෙක් දවසකට කසළ කිලෝවක් නිර්මාණය කරනවා. හැමෝම රාත්තල් දෙකහාමාරක පමණ කසළ නිපදනවා නොයෙක් ආකාරයෙන්. මේ කසළ අපි හිතලා බැලුවොත් වසරකට කිලෝ 365 ක්. අද ලංකාවේ සාමාන්‍ය ආයු කාලය ලෙස සලකන්නේ අවුරුදු 80 ක්. අවුරුදු 80 ක් කොළඹ නගරයේ ජීවත්වනවා කියා සිතුවොත් අපේ ජීවිත කාලය ඇතුළ කසළ ටොන් 30 ක් මහපොළවට මුදා හරිනවා.

අපි හැමෝම බොරැල්ල කනත්තේ වැලලෙන්න යනවා. ඒ සඳහා අඩි හයහාමාරක් දිග, අඩි තුනහමාරක් පළල වලක් කපනවා. ඒ වලේ තමයි අවසාන වශයෙන් වැලලෙන්නේ මිය යන මිනිසුන් ලෙස. හැබැයි අප මතක තබා ගත යුතුයි අපේ දේහය බොරැල්ල කනත්තේ වල දමන්න කපන වල වගේ 300 ගුණයක් විශාල වලක් අවශ්‍යයි අපි අවුරුදු 80ක් තිස්සේ බැහැරලන කසළ වලදමන්න. මීනි වලවල් 300ක් අවශ්‍යයි. එය තමයි අප විසින් මහ පොලවට මුදා හරින කසළ ගොඩේ පරිමාව. ඒ නිසා අපි හැමෝටම වගකීමක් තිබෙනවා, ඒ වගේ 300 ගුණයක කුණු කන්දක් මේ අවුරුදු 80 ක කාලය තුළ උපතේ සිට මරණය දක්වා අප ගොඩගසනවා. මේ සඳහා විසඳුමක් අපට අවශ්‍යයයි.

1989 ඉඳන් මීතොටමුල්ලට කුණු ගෙනත් දැම්මා. හැබැයි මීතොටමුල්ලට කොළඹ කුණු එන්න ගත්තේ ශේෂ්ඨාධිකරණය කුණු ප්‍රශ්නෙ විසඳන්න, සරත් එන් සිල්වා මහත්මයා රටේම ප්‍රශ්න විසඳන්න ගියා වගේ කුණු ප්‍රශ්නෙත් විසඳන්න ගිහින් මීතොටමුල්ලට කුණු දමන්න කියා නියෝගයක් දුන්නා. මුලින් මාස 6කට ඊට පස්සේ අවුරුදු 2 ට ඊට පස්සේ දිගටම. මුලින් අක්කර දෙකයි. ඊට පස්සේ 21 යි. මෙම වගුරු බිමේ දැන් කොහොම හරි ටොන් මිලියන 3 ක් කුණු තිබෙනවා. කුණු කන්ද නාය ගියහම එක්කෙනෙක්වත් ආවේ නැහැ එහි වගකීම භාර ගන්න. අපේ අමාත්‍යාංශය මගින් තමයි එහි වගකීම භාරගෙන එය ස්ථාවර කළේ. මාධ්‍යවලට ලොකු කතා කියන අය ඉන්නවා. මීතොටමුල්ල ඛේදවාචකයට සම්පූර්ණයෙන්ම ඒ කුණු දමපු අය වගකිව යුතුයි. මොකද ඒ කසළ කන්ද විධිමත්ව කළමනාකරණය කළේ නැහැ. මේ රටේ කැලෑ වල් අලියෙක්ගේ බර ටොන් තුනයි. ඔතන වල් අලි ගොඩගැසුවා නම් වල් අලි දශලක්ෂයක් ගොඩගසන්න තිබුණා මීතොටමුල්ලේ කුණු කන්දේ. ඒ කියන්නේ මේ මුළු ලෝක ඉතිහාසේ ඉඳන් හිටපු අලි ගෙනල්ලා ගොඩගැහුවත් මේ කුණු කන්ද ඊට වඩා ලොකුයි. මතක තබා ගන්න ගාලුමුවදොර පිටියට වඩා ලොකුයි. සාහසික අපරාධයක් මේ කර තිබෙන්නේ. මේ සඳහා පරිසරවේදියෝ තැන තැන උද්ඝෝෂණය කරනවා මේ සදහා ඔවුනුත් වගකිව යුතුයි. හැම තැනම දාන්න බැරිනම් කොහොමද මීතොටමුල්ලේ කුණු දාන්න කියන්නේ, කොහොමද දසලක්ෂ ගණන් ජීවත් වෙන කැළණි ගං දෙපස කුණු දාන්නේ. මේ පිළිබඳව පටු විදියට නොසිතා කසළ නිසි ලෙස බැහැර කරන සෑම තැනක් පිළිබඳව නිසි අධ්‍යනයකින් කටයුතු කළ යුතුයි.

පසුගියදා අප අග්‍රාමාත්‍යතුමා සමඟ චීනයේ සංචාරයක නිරත වුණා. එහිදි අප සොයා බැලුවා චීනයේ ධනවත්ම කාන්තාව පිළිබඳව, ඇය නමින් ෂැංයෙං. ඇය 1989 බීජිං නගරයේ ටියෙන්මාන් කැරැල්ලට සම්බන්ධවී රජය විසින් මර්දනයට කරනු ලැබූ මොහොතේ තම පෙම්වතා සමග ඇමරිකාවට පලා යනවා. ඇය යන්නේ ලොස්ඇන්ජලිස් නගරයට ඇය කෙටි කලකින් ව්‍යාපාරයක නිරත වෙනවා. ලොස්ඇන්ජලිස් නුවර තමයි ලොව ලොකුම කුණු කන්ද තියෙන්නේ. ඔවුන් මෙම කුණු කන්දේ කාඩ් බෝඩ් එකතු කරන්න පටන් ගන්නවා. එම කාඩ්බොඩ් චීනයට අපනයන කරනවා. ඇමරිකාවේ විශාලතම අපනයනය මෙයයි. අද ඇය චීනයේ මෙන්ම ලෝකයේම ධනවත් කාන්තාවක් බවට පත් වී තිබෙනවා. ඇයගේ වාර්ෂික ආදායම ඩොලර් බිලියන 4.4 ක් වෙනවා.

චීනයෙන් ඇමරිකා එක්සත් ජනපදයට නැව් ගණනාවක ඉලෙක්ට්‍රොනික උපාංග යවනවා. ඊට වඩා විශාල කන්ටේනර් ගණනාවක ඇමරිකාවෙන් චීනයට කසළ එවනවා. එය තමයි ඇමරිකා එක්සත් ජනපදයේ ලොකුම අපනයනය. කසළ කියන්නේ බලගතු සම්පතක්. ඇමරිකා එක්සත් ජනපදයට පමණක් නෙමෙයි අපේ ලංකාවටත් මේ වගුරු බිම් විනාශකරන, පස, වායුව, ජලය විනාශ කරන විනාශකා-දෙයක් නෙමෙයි මෙය බලගතු සම්පතක්. එය විධිමත්ව පරිහරණය කරන්න අපි හැමෝගෙම සමාජ වගකීමක් තිබෙනවා. එය ඉටුකරන්න අපි හැමෝම කටයුතු කරන්න ඕනේ.

මෙම කසළ කළමනාකරණය ලංකාවේ අසාර්ථක වෙන්න හේතු කිහිපයක් තිබෙනවා. එකක් තමයි නීතිමය වශයෙන් තිබෙන ප්‍රශ්නය. කසළවල අයිතිය තිබෙන්නේ පළාත් පාලන ආයතනවලට. නගර සභා ප්‍රාදේශීය සභා දැන් තිබෙන්නේ පළාත් සභා යටතේ. ඒ සඳහා කිසිවෙකු ඉදිරිපත් වුවහොත් මහ ඇමතිලා ඒ සඳහා විරුද්ධ වෙනවා. එය ඔවුන්ගේ වගකීමක් බැව් පවසා. මේ සඳහා නිශ්චිත නීත්‍යානුකූල වගකීමක් නැහැ. ඒ නිසා අතිගරු ජනාධිපතිතුමාටත් යෝජනා කළා මධ්‍යම පරිසර අධිකාරිය නාගරික සංවර්ධන අධිකාරිය වගේ අඩුගානේ මේ ප්‍රධාන නගරවල කසළ ටිකේවත් ගැටළුව විසඳන්න බලගතු කසළ කළමනාකරණ අධිකාරියක් දැන් රටට අවශ්‍යයි. එහෙම නැතිව මේ ගැටළුව විසඳන්න බැහැ. අඩුම තරමේ ප්‍රධාන නගර සඳහාවත් නිශ්චිත කසළ කළමනාකරණ අධිකාරියක් බිහි නොකරණතාක් මෙම ගැටලුව විසඳිය නොහැකියි. අනෙක් කාරණය අරමුදල්, මේ කසළ සඳහා මුදල් වියදම්කරන්න විදිහක් නැහැ. අපි ඒ කාළේ ඇති කළා ප්ලාස්ටික් සෙස් බද්ද. එයින් යම් මුදලක් එකතු කර දුන්නා මධ්‍යම පරිසර අධිකාරියට. අදටත් මධ්‍යම පරිසර අධිකාරියේ කසළ කළමනාකරණය සඳහා අප ආරම්භ කළ පිළිසරු ව්‍යාපෘතිය මිස එයට පිටින් එක වැඩපිළිවෙලක්වත් කිසි කෙනෙක් සාදා නැහැ. කසළ ජනනය කරන අය කසළ වියදම දැරිය යුතුයි. අද මේ හමුවේ අරමුණක් එය. සියළුම මහල් නිවාසවල අය තමන්ගේ කසළවල වගකීම භාරගත යුතුයි. ඒ කසළ නගර සභාවට දීලා එළියට දාලා නිදහස් වෙන්න බැහැ. ඒ කසළ පරිවර්ථනය කරන්න. කසළවලට විධිමත් පියවර ගන්න නගර සභාවට අරමුදල් වැයවෙනවා. ඒ බර සෑම නාගරිකයෙක්ම ගත යුතුයි. එහෙම නැතිව මේ ගැටළුව කවදාවත් විසඳිය නොහැකියි. තමන් විසින් ජනනය කරන කසළවල වියපැහැදම අදාල පුද්ගලයින් දැරිය යුතුයි. අදාල අයගෙන් එම වියපැහැදම් ලබාගෙන කසළ විධිමත් කළමනාකරණයකට යටත් කිරීම නගර සභාවල වගකීමක්. කසළ ඇතිවීම අවම කරන්න. කසළ වර්ගීකරණය කරන්න, දිරායන කසළ, දිරා නොයන කසළ ලෙස නගර සභාවලට භාරදෙන්න වගේම ඒ සඳහා යම් මිලක් අය කරන්න දැන් නගර සභාවලට සිදුවෙනවා. ඒ සඳහා සහයෝගය දීම ඔබගේ යුතුකමක්.

ඉදිරියේදී නාගරික සංවර්ධන අධිකාරිය මගින් ගොඩනැගිලි බලපත්‍ර ලබාගැනීමට නම් කසළ කළමනාකරණය පිළිබඳව විධිමත් ක්‍රියාවලියක් ඉදිරිපත් කළ යුතු වෙනවා. විශේෂයෙන්ම පසුගිය කාලේ කොළඹ මහ නගර සභාව,- දෙහිවල ගල්කිස්ස මහනගර සභාව, කොලොන්නාව නගර සභාව කිසිම ආකාරයක නිශ්චිත ක්‍රියාපටිපාටියකින් තොරව ගොඩනැගිලි දස දහසකට වඩා නීතිවිරෝධීව ඉදිකරන්න ඉඩ දී තිබෙනවා. ඒවා තමයි දැන් කඩා වැටෙන්නේ. අවාසනාවකට ඒවට යටවෙන මිනිසුන්ගේ අයිතිය වෙනුවෙන් උසාවි ගියහම ඒ අපරාධකාරයින්ව නිදහස් කරලා ගෙදර යවනවා. උසාවිවලින් යුක්තිය ඉටු නොවෙනකොට අහසේ හෙන තමයි දැන් බලාපොරොත්තු විය හැක්කේ. නමුත් නාගරික සංවර්ධන අධිකාරිය දැඩිව නීතිය ක්‍රියාත්මක කරනවා. මේ නීති විරෝධි ඉදිකිරීම්වලට ඉදිරියේ ඉඩ දෙන්නෙත් නැහැ, ඉදිකර තිබෙන එවටත් අපි නීතිය ක්‍රියාත්මක කරනවා. සියළුම දෙනා තමන්ගේ කසළවලට ස්ථානයක් අනිවාර්යයෙන්ම තමන්ගේ මහල්නිවාසවල පවත්වාගත යුතුයි. මහල් නිවාසවල විධිමත්ව මේ වැඩපිළිවෙල ස්වෙච්ඡාවෙන්ම කරගෙන යා යුතුයි. ඔබට කාලයක් දෙනවා එම කටයුත්ත සිදු කරන්න. නැතිනම් අපට සිදුවෙනවා මේ පිළිබඳව බලගතු පියවරයන් ගන්න. එනිසා නල ජලය පාවිච්චි කර ඉවත් කෙරෙන අප ජලය ටික කාණුවට දාන්න, තමනගේ කසළ ටික එළියට විසි කරන්න හෝ නගර සභාවට භාරදෙන්න, භාර දී අපි නිදහස් කියලා කියන්න මින් ඉදිරියට හැකියාවක් නැහැ. අපේ කසළවල වගකීම අප භාරගත යුතුයි. ඒ සඳහා ඔබ සියළු දෙනාම අපත් සමග සහයෝගයෙන් කටයුතු කරයි කියා බලාපොරොත්තු වෙනවා යැයි පැවසීය.

## ප්‍රධාන පුවත්

............................1 වැනි පිටුවෙන්

අතර එය නොබෝ දිනකින් මහජනතාව වෙත විවෘත කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය හා මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය අපේක්ෂා කරයි.

පොල්දුව හන්දියේ සිට සුහුරුපාය දක්වා මේ සඳහා රුපියල් මිලියන 560 ක මුදලක් රජය විසින් වෙන්කර ඇත. මෙහි දෙවන අදියරෙහි (සුහුරුපාය සිට කනත්ත පාර) කටයුතුද මේ වනවිට ආරම්භ කර ඇත.

මෙමගින් බත්තරමුල්ල මංසන්ධියේ අධික වාහන තදබදය සඳහා සහනයක් ලබාදීමට අපේක්ෂා කෙරේ.

### මීරිගම නගරයේ සතිපොළ ජනතා අයිතියට

මීරිගම නගරයේ විශාල අඩුපාඩුවක්ව පැවති බහුකාර්ය සතිපොළ නාගරික සංවර්ධන අධිකාරියේ රු.මි. 96 ක් වු ප්‍රතිපාදන මත ඉදිකරනු ලැබූ අතර, එය ජනතා අයිතියට පත්කිරීම 2017/04/06 වන දින ගරු මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය, පාඨලි චම්පික රණවක මැතිතුමන් අතින් උත්සවාකාරයෙන් සිදුකරනු ලැබීය.

මෙම සතිපොළ වෙළඳුන් 358 ප්‍රමාණයකට වෙළඳාම සඳහා පහසුකම් සපයන අතර, මීරිගම නගරයේ සහ අවට ප්‍රදේශවාසීන්ට සිය පාරිභෝගික අවශ්‍යතා පහසුම්ලට ඉටුකරගැනීමට මහත් වු පිටුවහලක් සපයනු ඇත.

මෙයට සමාගාමීව එදිනට රු.මි. 62.4 ක ප්‍රතිපාදන මගින් නවීකරණය කරන ලද මීරිගම නාගරික ක්‍රීඩාංගණයද ජනතා අයිතියට පත්කරන ලදී. මෙම උත්සව අවස්ථාව සඳහා ගරු මහනගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය, ලසන්ත අලගියවන්න මැතිතුමන්, මීරිගම ප්‍රාදේශීය ලේකම්තුමිය හා නාගරික සංවර්ධන අධිකාරියේ බස්නාහිර පළාත් අධ්‍යක්ෂතුමන් ඇතුළු පිරිස සහභාගී විය.



## නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති ආචාර්ය ජගත් මුණසිංහ මහතා

............................3 වැනි පිටුවෙන්

නාගරික පුණර්ජීවන ව්‍යාපෘතිය සැබවින්ම බලන කළ නාගරික සංවර්ධන අධිකාරියේ මූලික කාර්ය භාරය ලෙස ගැනිය නොහැක. එහෙත් රජය විසින් විශ්වාසයෙන් යුක්තව නාගරික සංවර්ධන අධිකාරිය වෙත මෙම වගකීම ඉටුකිරීමට පවරා තිබෙනවා. කෙසේ වෙතත්, මුල් කාලවලදී නාගරික සංවර්ධන අධිකාරිය විසින්ම සපයා ගනු ලැබූ ප්‍රතිපාදන මත මෙම ව්‍යාපෘතිය දියත් කරනු ලැබුණි. මෙහිලා හඳුන්වාදෙනු ලැබූ මූලික ක්‍රමවේදය වූයේ ව්‍යාපෘතිය යටතේ නිදහස් කරනු ලැබූ ඉඩම් ආයෝජකයන්ට පාරදෘශ්‍ය ක්‍රමවේදයක් හරහා ලබාදෙමින් එම මුදල් ව්‍යාපෘතිය සඳහා යෙදවීමයි. නමුත්, එසේ ලබාගන්නා මුදල්, ව්‍යාපෘතිය ඉදිරියට ගෙනයාම සඳහා කිසිසේත් ප්‍රමාණවත් නොවන බැවින්, අවස්ථා ගණනාවකදී රාජ්‍ය භාණ්ඩාගාරය වෙත කරුණු පැහැදිලි කිරීමක් සහ ගරු අග්‍රාමාත්‍යතුමන් කරුණු ඉදිරිපත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස යම් ප්‍රතිපාදන ප්‍රමාණයක් මේ වනවිට අධිකාරිය වෙත ලැබී ඇත. කෙසේ වෙතත් මේ සඳහා නුදුරු කාලයේදී රජයේ පුළුල් මැදිහත්වීමක් සිදුවේ යැයි අධිකාරිය අපේක්ෂා කරයි.

.

## නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්තුමා සමඟ පැවති සම්මුඛ සාකච්ඡාව

............................5 වැනි පිටුවෙන්

මොරටුව විශ්ව විද්‍යාලයේ මහාචාර්ය අමල් කුමාරගේ ඇතුළු කණ්ඩායම් සිදුකරන ලද සමීක්ෂණයක ප්‍රතිඵල අනුව මහනුවර නගරයේ වාහන තදබදයට මූලික ගැටළුව වන බස්රථ ගාල් කර තැබීම සඳහා සුදුසු ස්ථානයක් ලබාදීමෙන් මෙම නාගරිකය තුල ඇතිවන තදබදය නිමා කිරීමට හැකි බව හෙලිදරව් වී තිබෙනවා.

මීට සමගාමීව නගරයේ පොදු පහසුකම් සහ පදික මංතීරු වැඩිදියුණු කිරීම නගරයේ සනීපාරක්ෂක පද්ධතිය සහ ජල ප්‍රවාහන පද්ධතිය වැඩි දියුණු කිරීම සහ නගරයෙන් පිටත මාර්ග කිපයක් වැඩි දියුණු කිරීමේ කටයුතුද දැනටම සිදුවෙමින් පවතිනවා.

ගාල්ල නගරයේ මීට සමාන ලෙසම පොදු පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ඉදිකිරීම් කරමින් පවතිනවා. උනවටුනේ සිට ගාල්ල කොටුව දක්වා වෙරළ ආශ්‍රිතව පදික මංතීරුවක් සංචාරක පහසුකම් වැඩි දියුණු කිරීමේ අරමුණින් ඉදිවෙමින් පවතිනවා.

යාපනය, ත්‍රිකුණාමලය සහ අනුරාධපුරය යන නගර උපාය මාර්ගික නගර ලෙස සංවර්ධනය කිරීමට සැලසුම් සකස් වෙමින් පවතිනවා. ත්‍රිකුණාමලය නගරය සඳහා ප්‍රතිපාදන ලෙස ඩොලර් මිලියන 50 ක් දැනටම අනුමත වී තිබෙනවා. මීට අමතරව කුරුණෑගල, රත්නපුර සහ මාතර යන නගරයන් ඉදිරි කාලයේදී උපාය මාර්ගික නගරයන් බවට හඳුනාගෙන ඒ සඳහා සැලසුම් සකස් වෙනු ඇත.

**උපාය මාර්ගික නගර යන්නෙන් අදහස් වන්නේ කුමන ආකාරයේ නගරද?**
මේවා නාගරිකරණය වේගය අනුව ඉතා ඉහළ මට්ටමක පවතින නාගරිකයන් ඒ ඒ නාගරිකයන් වෙතට ජනතාව සීඝ්‍රයෙන් ආකාර්ශනය වෙමින් පවතිනවා. එසේම අනුරාධපුර, පොලොන්නරුව බඳු නගර ඉතා නුදුරේදි මෙම උපාය මාර්ගික නගර තත්වනට පත්වීමේ ප්‍රවනතාවයක් පවතින බව හඳුනාගෙන තිබෙනවා.



## බෞද්ධ පුවත්

නාගරික සංවර්ධන අධිකාරියේ බෞද්ධ සංගමය මගින් වාර්ෂිකව වෙසක් උත්සවය අරමුණු කරගෙන පවත්වනු ලබන ධර්ම දේශනාවේ 2017 වර්ෂය සදහා වු ධර්ම දේශනාව මැයි මස 4 දින පවත්වනු ලැබිය. ඒ සඳහා වැඩම කොට වදාලේ කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමාග්‍රි ධර්ම මහා සංඝ සභාවේ නායක දුරන්දර අතිපූජ්‍ය ආචාර්ය ඉත්තෑපානේ ධම්මාලංකාර ස්වාමීන්ද්‍රයන් වහන්සේය.

# ස්වර්ණවාහිනී සේවය මෙහෙයවන මහජන සේවය පිණිසයි වැඩසටහනට සහභාගීවෙමින් නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්තුමා අදහස් දක්වමින්



**ග්‍රීන් රේටින් (නීල හරිත) ක්‍රමවේදය පිළිබඳව ලෝකය පුරාම කතිකාවක් සිදුවෙමින් පවතින කාලයක, නාගරික සංවර්ධන අධිකාරිය කුමන ආකාරයේ පිළිවෙතක්ද අනුගමනය කරන්නේ**

තිරසර සංවර්ධනයක් යන අතිගරු ජනාධිපතිතුමන්ගේ සංකල්පය යටතේ නීල හරිත ශ්‍රී ලංකා යන ව්‍යාපෘතිය ආරම්භ වුණා. ඒ අනුව, පරිසර අමාත්‍යාංශය යටතේ ආරම්භ වුන මෙම ව්‍යාපෘතිය සඳහා මාර්ගෝපදේශක්තව සංග්‍රහය නිර්මාණය කිරීම නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරෙන ලදි.මෙම අභියෝගය නාගරික සංවර්ධන අධිකාරිය විසින් භාරගෙන ශ්‍රී ලංකාවේ ගොඩනැගිලි හරිතකරණය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහය පිළියෙල කරනු ලැබුවා. ඒ අනුව, 2017 ජනවාරි මස සිට සියළු රජයේ ගොඩනැගිලි මෙම හරිත සංකල්පයට අනුව පවත්වාගෙනයාමත්, නව ඉදිකිරීම් සියල්ලම එම සංකල්පයට අනුව ඉදිකිරීමටත් රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගනු ලැබුවා. 2017 වර්ෂයේ ජනවාරි මස 08 වන බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවැති සමාරම්භක සැසියෙන් අනතුරුව මේ වනවිට පුහුණු පාඨමාලා ගණනාවක් මේ සංකල්පය පිළිබඳව දැනුවත් කිරීම සඳහා පවත්වනු ලැබුවා. නමුත්, මේ වනවිටත් මෙහි දැනුවත්භාවය ප්‍රමාණවත් නැති බව අපට පෙනි යනවා. එනිසා ඉදිරියටත් මෙම අවබෝධය වැඩිදියුණු කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් සිටිනවා.

**මෙගාපොලිස් ව්‍යාපෘතිය සැලසුම් කළ කාලරාමුව තුළ සිදුවෙමින් පවතිනවාද ? එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී පැන නැගී ඇති දුෂ්කරතා මොනවාද ?**

බස්නාහිර ප්‍රදේශ සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කර මේ වනවිට වර්ෂ 2 මාස 06 ක පමණ කාලයක් ගතව ඇත. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ඉලක්කය වූයේ බස්නාහිර පළාතේ සීඝ්‍ර සංවර්ධනය වේගවත් කිරීමයි. ඒ අනුව, දැනට මිලියන 05 ක ජනතාවක් පදිංචිව ප්‍රදේශය 2030 වන විට මිලියන 08 ක ජනතාවක් පදිංචිවන මහානගරයක් බවට පත්වනු ඇතැයි අපේක්ෂා කරනවා. මේ අනුව, මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ඉලක්කයන් වන්නේ මිලියන 08 ක ජනතාවට අවශ්‍ය මූලික පහසුකම් සැපයීමත් අපේක්ෂිත රැකියා ප්‍රමාණය ජනනය කිරීමත් යන්නයි. ඊට අදාළ සැලසුම් සකස් කිරීමේ කටයුතු මේ වනවිට අවසන් කර තිබෙනවා. බස්නාහිර ප්‍රදේශ සංවර්ධන අමාත්‍යාංශය යටතේ ව්‍යාපෘති කාර්යාල 07 ක් ආරම්භ කර අවසන්. පරිපාලන නගරය, තාක්ෂණ නගරය, ඒකල ගුවන් විදුලි සංස්ථා ඉඩම මූලික කරගත් ගුවන් තොටුපල සංවර්ධනය වන ගුවන් නගරය, එමෙන්ම දැනට ඉදිවන පෝර්ට් සිටි ආශ්‍රිත මූල්‍ය නගරයේ සිට පානදුර දක්වා කලාපය නාවික නගරය ලෙසත් සංවර්ධනය කිරීම මෙන්ම කොළඹ චාර්මස් ඉඩම, බේරේ ආශ්‍රිත ඉඩම් වාණිජ නගරය සඳහා කේන්ද්‍ර කරගනිමින් මධ්‍යම ව්‍යාපාර දිස්ත්‍රික්කය ලෙස සංවර්ධනය කිරීමත්, මීරිගම, ඉංගිරිය සහ හොරණ කර්මාන්ත කලාප ඇති කිරීම යන ව්‍යාපෘති සමඟ මේ සියල්ල ඒකාබද්ධ කරන නාගරික ප්‍රවාහන පද්ධතිය ස්ථාපනය කිරීම මෙහි මූලිකාංගවේ. ඉන් පරිපාලන නගරය ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ සෘජු මැදිහත්වීමක් සිදුවෙනවා. ඒ අනුව, මේ වනවිට විශාල සංවර්ධනයක් සඳහා වූ මූලික පියවරයන් සකස් කොට හමාරයි. එය මහජනතාවට සන්නිවේදනය කිරීම සිදුකළ යුතුව පවතිනවා.

**පරිපාලන නගරය ඉදිකිරීමේදී සිදුවන කාර්යය පැහැදිලි කරනවා නම්,**

බත්තරමුල්ල ප්‍රදේශය මූලික කරගෙන සෙත්සිරිපාය තෙවන අදියර අගෝස්තු මස ක්‍රියාත්මක වෙනවා. අඩි ලක්ෂ 10 ක වර්ග ප්‍රමාණයක මෙම ගොඩනැගිල්ල සඳහා ඉඩ පහසුකම් සැලසෙනවා. මෙහි ඉලක්කය වන්නේ කොටුව ප්‍රදේශයේ පවතින කාර්යාල එම සංකීර්ණයටත් අසල පවතින අනෙකුත් සංකීර්ණයන් වෙත රැගෙනඒමයි. එසේම, ජනාධිපති කාර්යාලයත්, අගමැති කාර්යාලයත් පාර්ලිමේන්තු සංකීර්ණය අවට ස්ථාපිත කිරීමටත් සැලසුම් කර තිබෙනවා. මෙය කේන්ද්‍ර කරගෙන පරිපාලන නගරය බිහිකිරීමට අපේක්ෂා කරනවා. එසේම එම නගරය සහ කොළඹ නගරය සම්බන්ධ කරමින් සැහැල්ලු දුම්රිය මාර්ග පද්ධතියක් ඉදිකිරීමට නියමිතයි. දුම්රිය මාර්ග පද්ධතියේ වැඩකටයුතු මේ වනවිට ආරම්භ කර ඇති අතර, ජපන් රජය ආධාර සැපයීමට ඉදිරිපත්ව සිටිනවා. ජපන් විශේෂඥයන් කණ්ඩායමක් මේ වනවිටත් අදාළ සැලසුම් සකස් කරමින් සිටිනවා. මාලබේ සිට බොරැල්ල දක්වාත්, බොරැල්ල සිට කොල්ලුපිටිය, බම්බලපිටිය සහ කොටුව දක්වාත් ඉදිකිරීමට සැලසුම් කර තිබෙනවා. 2018 වර්ෂයේ මැද භාගය වනවිට මෙහි ඉදිකිරීම් ආරම්භ කිරීම සිදුවෙනවා. ඒ හැර මේ ආශ්‍රිතව තවත් දුම්රිය මාර්ග 05 ක් ඉදිකිරීමට ආයෝජකයන්ගෙන් සහ කොන්ත්‍රාත්කරුවන් ගෙන් දැනටමත් ලංසු කැදවීමට පෙර කැමැත්ත ප්‍රකාශ කිරීමේ ඉල්ලීම් කැඳවා තිබෙනවා. තාක්ෂණ නගරය ඉදිකිරීමේ මුල්ම අඩිතාලම තබනුයේත්, නාගරික සංවර්ධන අධිකාරිය විසිනි. ඊට අදාළව කොට්ටාව මාහේන වත්තේ නාගරික සංවර්ධන අධිකාරිය සතුව තිබූ අක්කර 92 ක ප්‍රමාණයක්, කොළඹ විශ්ව විද්‍යාලය, මොරටු විශ්ව විද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සහ ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය වෙත බෙදා දෙන ලදි. ඒ අනුව, 2018 වර්ෂයේ මුල් භාගයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන බව විශ්ව විද්‍යාල කොමිෂන් සභාව විසින් දැනුම් දී ඇත. මේ අනුව, විශ්ව විද්‍යාල උපකුලපතිවරුන් ලබාදෙන තොරතුරුවලට අනුව, විශ්ව විද්‍යාල සිසුන් 15000 කට පමණ සිටින විශ්ව විද්‍යාල නගරයක් බිහිවනු ඇතැයි අපේක්ෂා කරනවා. කොට්ටාව මාහෙන වත්ත ප්‍රදේශයේ අවශ්‍ය සියළු පහසුකම් සැපයීම මේ වනවිට සිදුකරගෙන යනවා. එපමණක් නොව මෙම තාක්ෂණ නගරය සංවර්ධනයත් සමඟ කඩුවෙල නගර සංවර්ධනයත් සමගාමීය සිදුවෙමින් පවතිනවා.

**මේවා ඉටුකිරීමේදී කවර අභියෝගයන්ට මුහුණදීමට සිදුවේද ?**

බස්නාහිර මහනගර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඉඩම් අත්පත්කරගැනීමේ අභියෝග සහ ඒ සඳහා වන්දි ගෙවීමේ ගැටළු, පවත්නා පරිසර නීතින් සමඟ කටයුතු කිරීම වැනි නොයෙක් අභියෝගයන්ට මුහුණදීමට සිදුවිය හැකියි. එමෙන්ම මෙම ව්‍යාපෘතිවලින් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව ජනතාවට සෘජු ප්‍රතිලාභයන් නොලැබෙන අවස්ථාවල ඔවුන්ගෙන් එල්ල වන විරෝධතා සහ ප්‍රතික්‍රියා කළමනාකරණය කිරීම දුෂ්කර විය හැකියි. එයට හේතු වන්නේ මෙගා පොලිස් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන්නේ ජනතාවගෙන් පිරුණු නගර ආශ්‍රිතවයි ව්‍යාපෘතිය මහවැලි ව්‍යාපෘතිය මෙන් දුර බැහැර ප්‍රදේශවල සිදුවන්නක් නොවේ.

**ඔබ මෙතෙක් සඳහන් කර ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීමේදී රට තුල පවත්නා ඉංජිනේරු දැනුම සහ තාක්ෂණ දැනුමත් ප්‍රමාණවත් යැයි සිතන්නේද?**

සැහැල්ලු දුම්රිය මාර්ග පද්ධය බදු ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකාව තුල පවත්නා ඉංජිනේරු ඥානය ප්‍රමාණවත් නොවන බව මගේ වැටහිමයි. එබදු අවස්ථාවලදී එම හැකියාව පවතින ඉංජිනේරු දැනුම අපට බාහිරින් ලබාගැනීමට සිදුවේවි.

එසේම පිටකොටුව ආශ්‍රිතව සැලසුම් කර ඇති බහුවිධ ඒකාබද්ධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීමේදිත් පවතින අත්දැකිම් ප්‍රමාණවත් නොවන බව පැහැදිලිය. මෙවැනි අවස්ථාවලදී අදාල තාක්ෂණ ඥානය ඉංජිනේරු ක්‍රමවේදයන් බාහිරින් ලබාගැනීමට සිදුවේවි.

එහෙත් අනෙකුත් ඉදිකිරීම් සඳහා ඉහළ ඥානයක් පවතින ශිල්පිය හැකියාවන් ඇති ප්‍රමාණවත් පිරිසක් ලංකාව තුල සිටිනවා.

**කොළඹ, ගාල්ල මහනුවර වැනි නාගරිකයන් තුල නාගරික සංවර්ධන අධිකාරියේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතින් වල තත්වය කෙබඳුද?**

මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක වන්නේ මහානගර සංවර්ධන හා බස්නාහිර පළාත් අමාත්‍යාංශය යටතේ උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය ලෙස මෙය ක්‍රියාත්මක වේ. නමුත් අවශ්‍ය සියලු පහසුකම් සැපයීම නාගරික සංවර්ධන අධිකාරිය මගින් සිදු කෙරේ. මහනුවර නගරය සහ ගාල්ල නගරයේ දැනටම මෙම ව්‍යාපෘතින් ක්‍රියාත්මක වෙනවා. නගර දෙක සඳහා ඩොලර් මිලියන 140 ක මුදලක් ආයෝජනය කර තිබෙනවා.

මහනුවර නගරය තුලට දිනකට බස්රථ 4000 ක් පමණ ගමන් වාර සංඛ්‍යාවක් සිදුවන බව හඳුනාගෙන තිබෙනවා. ඒ නිසා ප්‍රවාහන මධ්‍යස්ථානයක් ඉදිකිරීමට අපේක්ෂිතයි.

........................4 වැනි පිටුවට



# නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය

පුරවැසියන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීම පිණිස නිවැසියන් නවීන නිවාසයන්හි පුනස්ථාපනය කිරීම මගින් නගරයේ මුඩුක්කු, පැල්පත් සහ ජරාවාස වූ අනෙකුත් නිවාස ඉවත් කිරීම.

නාගරික සංවර්ධන අධිකාරියේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය මඟින් කොළඹ නගරයේ විසිරී පවතින අඩු පහසුකම් සහිත ජනාවාස පුනස්ථාපනය කර එමගින් මෙම ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීමටත් නිදහස් කරගන්නා ඉඩම් ප්‍රශස්ථ භාවිතයන් සඳහා යෙදවීමටත් කටයුතු කරනු ලැබේ.

ඒ අනුව, 2010 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සිදුකරනු ලැබූ සමීක්ෂණයක් අනුව අඩු පහසුකම් සහිත ජනාවාස 1500 ක පමණ පවුල් 68000 කට අධික ප්‍රමාණයක් ජීවත් වන බව හඳුනාගන්නා ලදි.

ඒ අනුව නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියෙහි පළමු අදියර යටතේ නිවාස ඒකක 5667 කින් සමන්විත නිවාස ව්‍යාපෘතීන් 12 ක් ජනතා අයිතියට පත්කර ඇති අතර දෙවන අදියර යටතේ නිවාස ඒකක 10360 කින් සමන්විත තවත් නිවාස ව්‍යාපෘතීන් 11 ක් ජනතා අයිතියට පත් කිරීමට නියමිතය .2017 වසර තුළ නිවාස ඒකක 5000 ක පමණ වැඩ නිම කිරීමට බලාපොරොත්තු වේ.

නිරන්තරයෙන් ගංවතුර, විවිධ ලෙඩ රෝග ආදී තත්වයනට මුහුණ දුන් මෙම අඩු පහසුකම් ජනාවාසවල පදිංචිකරුවන් හට නව මහල් නිවාස ව්‍යාපෘති තුළින් වර්ග අඩි 450 - 550 අතර සියලු පහසුකම් වලින් සමන්විත නිවසක් ලැබීම තුළින් නීතිමය ලිපිනයක් සහිතවීම, සුරක්ෂිත බව, නීත්‍යානුකූල බව තහවුරු වූ නිවසක් ලැබීම මඟින් ඔවුන්ගේ ජීවන මට්ටම උසස් කරලීමට අවස්ථාව ලැබී ඇත.

එසේම මෙම නිවැසියන්ගේ අවශ්‍යතා සපුරාගත හැකිවන පරිදි හා වැඩිවන ඉදිරි ජනගහනය ඉලක්කගත කරගනිමින් මෙම මහල් නිවාස සංකීර්ණයන් අවට ප්‍රදේශයන්හි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, ආර්ථික හා සමාජීය පහසුකම් සැලසීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීමට ද නාගරික සංවර්ධන අධිකාරිය කටයුතු කරමින් සිටී.

# මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘතිය



ශ්‍රී ලංකා රජයේ සංකල්පයක් මත රාජ්‍ය හා පුද්ගලික ආයතනයන්හි සේවකයින් සඳහා ඔවුන්ගේ ආදායමට දැරිය හැකි නිවාස 500000 කින් සමන්විත වූ මධ්‍ය පාන්තික නිවාස ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු යොදන ලදි. ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙහි හා නිවාස සංවර්ධන අධිකාරියෙහි මැදිහත් වීම රජය අපේක්ෂා කරන ලදි.

ඒ අනුව, නාගරික සංවර්ධන අධිකාරියේ මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘතිය, නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශයන්හි රජයේ හා පුද්ගලික ආයතනයන්හි සේවය කරනු ලබන එහෙත් තම රැකියා ප්‍රදේශය ආශ්‍රිතව නේවාසික පහසුකම් ලබාගැනීමට පිරිවැයක් දැරීමට හැකියාවක් නොපවතින සේවකයින් ඉලක්කගත කරමින් ආරම්භ කරන ලදි.

එහි පළමු අදියර යටතේ ක්‍රියාත්මක කොළඹ 08, බොරැල්ල, පැලැන්ගස්තුඩුව නිවාස ඒකක 608 කින් සමන්විත මහල් නිවාස ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින අතර ඒ සඳහා අයදුම්පත් 1500 කට අධික ප්‍රමාණයක් ලැබීම තුළින්ම මෙම අංශවල සේවකයන්ගේ නිවාස අවශ්‍යතාවය හඳුනාගත හැකිය. මේ යටතේ මේ වසර තුළ නිවාස ඒකක 3000 ක් ආරම්භ කිරීමට යෝජිතය.

එසේම කොළඹ නගරාශ්‍රිත ව්‍යාපෘතීන්වලට අමතරව මහනුවර, අනුරාධපුරය, ගම්පහ, කුරුණෑගල, බණ්ඩාරවෙල ආදී නගරාශ්‍රිතවද නිවාස ව්‍යාපෘතීන් ආරම්භ කිරීමට මෙම ව්‍යාපෘතිය මඟින් කටයුතු කරගෙන යනු ලැබේ.



# බේරේ වැව සංවර්ධන ව්‍යාපෘතිය

කොළඹ වාණිජ අගනගරය මධ්‍යයේ පිහිටි බේරේ වැව ප්‍රතිසංස්කරණය සඳහා දැනටමත් ඒකාබද්ධ සැලැස්මක් පිළියෙල කර ඇති අතර එමගින් දැනට අපවිත්‍රව ඇති බේරේ වැව පවිත්‍ර කිරීමත්, බේරේ වැව වටා පිහිටි ඉඩම් ප්‍රශස්ත භාවිතයන්ට යොදා ගැනීම තුලින් රටේ ආර්ථික සංවර්ධනය සඳහා දායකත්වය ලබාදීමත් අරමුණු කොට ඇත. මේ යටතේ කොළඹ නගරය වඩාත් සුභදායි පරිසරයක් නිර්මාණය වන්නා සේම මහජන සුවදායි පරිසරයක්ද බිහිවන්නේය.

උක්ත සැලසුම් යටතේ ලෝක බැංකු ආධාර මත කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ නාගරික සංවර්ධන අධිකාරිය මගින් පහත සඳහන් උප ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

**රේඛීය උද්‍යාන I සහ II**

මෙම ව්‍යාපෘතිය යටතේ බේරේ වැව වටා මීටර් 6 ක රක්ෂිතයක් විවෘතකර තීරු උද්‍යානයක් ඉදිකිරීමට යෝජනා කර ඇත. මෙහි ප්‍රධානතම අරමුණ වනුයේ බේරේ වැව අවට ඇති ඉඩම් කට්ටි සඳහා වැඩි වටිනාකමක් ලබාදෙමින් ඒවා නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම්වලට අනුව සංවර්ධනය කර රටේ ආර්ථිකය නැංවීමේ කාර්යයට උර දීමයි.

ඒ අනුව නැගෙනහිර බේරේ වැව වටා කි.මී. 2.3 ක් පමණ දුරක් ආවරණය වන පරිදි මෙම රේඛීය උද්‍යානය ඉදිකිරීමේ කටයුතු ආරම්භකර ඇත. ඒ සඳහා රු.මිලියන 500ක් පමණ වැය කිරීමට යෝජිතය.

රේඛීය උද්‍යාන අදියර - I (කි.මී. 1.8) නොබෝ දිනකින් මහජනතාව වෙත විවෘත කිරීමට බලාපොරොත්තු වන අතර එහි අදියර II (කි.මී. 1.2) මෙම වසර අවසන් වන විට මහජන අයිතියට පැවරීමට යෝජිතය.

**අඩු පහසුකම් සහිත ජනාවාසයන්හි පදින්චිකරුවන්හට නව නිවාස ලබාදීම**

බේරේ වැව අවට අඩු පහසුකම් සහිත ජනාවාසයන්හි පදින්චිකරුවන්හට නව නිවාස ලබාදීමේ වැඩසටහන මේ වනවිටත් ආරම්භ කර ඇති අතර, නාගරික සංවර්ධන අධිකාරි යෙහි නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය මගින් නව නිවාස ලබාදීම සිදුකරනු ලබයි. මේ සඳහා ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 1350 කි.



## මුදල් අංශයෙහි කාර්ය සාධනය

කොළඹ නගරය තුල හා ඒ අවට ජීවත් වන පැල්පත්ලාභීන්ගේ ජීවන හා සමාජීය තත්වය ඉහල නංවාලීමේ අරමුණින් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් 2010 වර්ෂයේදී ආරම්භ කරන ලද අඩු ආදායම්ලාභී නිවාස ව්‍යාපෘතිය වෙනුවෙන් මේ වන විට ආසන්න වශයෙන් රුපියල් බිලියන 27 ක මුදලක් දරනු ලැබ ඇති අතර එමඟින් ඉදිකිරීමට යෝජිත නිවාස ඒකක 20,000 න් 5,599 ක් නිවාසලාභීන් වෙත ලබා දී ඇති අතර තවත් නිවාස ඒකක 12,000 ක පමණ ඉදිකිරීම් කටයුතු අවසන් කරමින් පවතී. එම ඉදිකිරීම් වෙනුවෙන් හා ආසන්න වශයෙන් රුපියල් බිලියන 29 කට ආසන්න මුදලක් යෙදවීමට නාගරික සංවර්ධන අධිකාරිය ඇස්තමේන්තු කර ඇත. ඊට අමතරව මෙම ව්‍යාපෘතිය මූල්‍යණය කිරීම සඳහා ලංකා බැංකුවෙන් හා මහජන බැංකුවෙන් 2015 වර්ෂයේ දී ලබා ගෙන තිබූ රුපියල් බිලියන 15 කට ආසන්න ණය මුදල් පියවීම සඳහා රුපියල් බිලියන 8.5 ක් මෙම වර්ෂයේ ප්‍රථම කාර්තුව තුලදී මහා භාණ්ඩාගාරය මඟින් ලබා ගැනීමට කටයුතු සිදු කරන ලදි.

නාගරික සංවර්ධන අධිකාරියෙහි මුදල් අංශය විසින් දැනට භාවිතා කරනු ලබන වසර 20 ක් පමණ පැරණි ගිණුම්කරණ පද්ධතිය වෙනුවට නව ගිණුම්කරණ පද්ධතියක් (Online System) හදුන්වා දීමට කටයුතු කරමින් පවතින අතර ඉදිරියේදී මෙමඟින් මූල්‍ය කටයුතු හා සම්බන්ධ වැඩ කටයුතු සාර්ථකව හා කාර්යක්ෂමව සිදු කර ගැනීමට හැකි වී ඇත

## නාගරික සංවර්ධන අධිකාරිය විසින් මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති

නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2017 වර්ෂයේදී මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් රු.මිලියන 8.81 මුදලක ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් සිටි. මෙම මුදල ජාතික අයවැයෙන් ලබාදුන් ප්‍රතිපාදන හා අයවැය යෝජනා අනුව මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය සඳහා ලබාදුන් ප්‍රතිපාදන වේ.

මේ යටතේ ව්‍යාපෘති කොන්ත්‍රාත්තු 172 ක් හඳුනාගෙන ඇති අතර, ව්‍යාපෘති 135 කර මේ වන විටත් වැඩ භෞතිකව ආරම්භ කර ඇත. ඒ අතුරෙන් ව්‍යාපෘති 64 ක් මේ වන විට සම්පූර්ණයෙන් අවසන් කර ජනතා අයිතියට පත්කිරීමට නියමිතව ඇත.

මෙම ව්‍යාපෘති මඟින් නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ප්‍රකාශිත නාගරික ප්‍රදේශ වල භෞතික සංවර්ධනය මෙන්ම ආර්ථික හා සමාජීය සංවර්ධන ඉලක්ක කර ගත් උපායමාර්ගික ව්‍යාපෘතීන් ලෙස හඳුන්වාදිය හැකිය.

මෙම ව්‍යාපෘති මඟින් නාගරික අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය සඳහා විවිධ වූ ඉදිකිරීම් සඳහා ඉඩම් සංවර්ධනය කිරීම මාර්ග සංවර්ධනය කිරීම් පොදු පහසුකම් සංවර්ධනය හා නගර අලංකරණ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වෙයි. මෙම ව්‍යාපෘති අතර මැනිං වෙළඳ සංකීර්ණය පෑලියගොඩ ප්‍රතිස්ථාපනය කිරීම වැනි ජාතික වශයෙන් වැදගත් ව්‍යාපෘතින් මෙන්ම ප්‍රාදේශීය වශයෙන් වැදගත් ව්‍යාපෘතීන් රාශියක්ද ක්‍රියාත්මක කිරීම තුලින් එම ප්‍රදේශ වල තිරසාර සංවර්ධනයක් ඇති කිරීම අපේක්ෂිතය.

## දීප උයන ව්‍යාපෘතිය - පොළොන්නරුව

අතිගරු ජනාධිපතිතුමාගේ පිබිදෙමු පොළොන්නරුව වැඩසටහනට සමගාමීව පොළොන්නරුව පූජා නගරය ආශ්‍රිතව මෙම ව්‍යාපෘතිය ඉදිකෙරේ.

දිනපතා පොළොන්නරුව නගරයට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන්හට අවශ්‍ය නවීන පහසුකම් වලින් සමන්විත අංග සම්පූර්ණ වැසිකිලි පද්ධතියක්, ජල උද්‍යානයක්, ඇවිදින මංතීරු, රථවාහන නැවතීමේ පහසුකම්, විවේක ගැනීමේ හා ආහාර ගැනීමේ පහසුකම් සහ පානීය ජල පහසුකම් වලින් මෙම ව්‍යාපෘතිය සමන්විත වේ.

මෙම ව්‍යාපෘතිය සඳහා දැනට රු. මිලියන 90 ක් පමණ වැය වී ඇති අතර මූල්‍ය දායකත්වය උතුරු මැද පළාත් සභාව මගින් සිදුකරන අතර , නිර්මාණ හා වාස්තුවිද්‍යාත්මක උපදෙස් නාගරික සංවර්ධන අධිකාරියේ පරිසර හා භූ දර්ශන අංශය මගින් සිදු කරනු ලබයි.



## " නීල හරිත ශ්‍රී ලංකා" ශ්‍රී ලංකාවේ රාජ්‍ය/අර්ධ රාජ්‍ය ගොඩනැගිලි සඳහා "හරිත ප්‍රමිති මට්ටම්" ලබා දීමේ ක්‍රමවේදය

මානව සංහතියටත් පරිසර සමතුලිතතාවයටත් ගොඩනැගිලි ක්ෂේත්‍රය තුලින් වන බලපෑම පාලනය කිරීම සඳහා ශ්‍රී ලාංකීය රජය විසින් ගත් කාලෝචිත ක්‍රියාමාර්ගයක් ලෙස " නීල හරිත ශ්‍රී ලංකා " සංකල්පය හැඳින්විය හැකිය. ශ්‍රී ලංකාව විසින් තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කරගැනීමට යාමේදී මෙම ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා පරිසර හිතකාමී හරිත ගොඩනැගිලි ක්‍රමවේදයක් ඇති කිරීම මඟින් ඉහත කී තත්ත්වයට තිරසාර විසඳුමක් ලබාදීමේ අරමුණෙන් 2017 වසරේ සිට ඉදිකරනු ලබන ගොඩනැගිලි සැලසුම් කිරීමේදී, ඉදිකිරීමේදී හා පවත්වාගෙන යාමේදී හරිත සංකල්පය යොදා ගැනීම මේ වන විට ආරම්භ කර ඇත. මෙම ක්‍රමය සමස්ථ ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහාම ඉදිරියේදී යොදා ගැනීමට අපේක්ෂා කරන අතර මෙහි පළමු පියවර ලෙස හරිතකරණය කිරීම සඳහා රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ගොඩනැගිලි පමණක් සැලකිල්ලට ගනු ලැබේ.

හරිත සංකල්පයට අනුව ඉදිකෙරෙන රාජ්‍ය හා අර්ධරාජ්‍ය අංශයේ ගොඩනැගිලි සඳහා 2017 වසරේ සිට මහනගර හා බස්නාහිර පළාත් අමාත්‍යාංශය යටතේ ඇති නාගරික සංවර්ධන අධිකාරිය මඟින් හරිත තත්ත්ව සහතිකයක් ලබා දෙන අතර මෙහිදී ගොඩනැගිල්ලක් ඉදිකිරීම, පවත්වාගෙන යාම හා කඩා බිඳ දමා ඉවත් කිරීම යන සම්පූර්ණ ක්‍රියාදාමය ඇගයීමට ලක්වේ. මෙම කාර්යය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් මේ වසරේ ජනවාරි මසදී රාජ්‍ය ආයතන ගණනාවක සහභාගීත්ව යෙන් සකස් කල ශ්‍රී ලංකාවේ හරිත ගොඩනැගිලි ප්‍රමිති මට්ටම් ඇගයීමේ ක්‍රියාවලිය ඇතුලත් ග්‍රන්ථ සංග්‍රහය යොදා ගත යුතුය.

මෙම නව ඉදිකිරීම්හි පරිසර හිතකාමී බව මැන බැලීම නාගරික සංවර්ධන අධිකාරිය තුල ස්ථාපිත කර ඇති තාක්ෂණික කමිටුවේ නිරීක්ෂණයෙන් සහ විද්වත් මණ්ඩලයේ අනුමැතියෙන් සිදුකරන අතර මෙහිදී බලශක්ති කාර්යක්ෂමතාවය, තිරසර භූමි සැලසුම්කරණය හා කළමනාකරණය, අමුද්‍රව්‍ය සහ සම්පත් කළමනාකරණය , ගොඩනැගිලි ඇතුලත පරිසරයේ ගුණාත්මකභාවය, ජල කාර්යක්ෂමතාවය, හරිතමය නව්‍යකරණය හා ඒවායේ සමාජීය හා සංස්කෘතිමය අනුකූලතාවය යනාදී ලෙස අංශ 07 ක් ඇගයීමට ලක් කෙරේ.

අවසානයේදී එම ගොඩනැගිල්ල සඳහා ලබා දිය හැකි සම්පූර්ණ ලකුණු ගණන තීරණය වන අතර එම ගොඩනැගිල්ලට සුදුසු හරිත ප්‍රමිති මට්ටම ලබා දේ.

එම ගොඩනැගිල්ල ලබාගත් ලකුණු ගණන 70 ට වැඩි නම් ප්ලැටිනම් සහතිකයද,

60 - 69 අතර නම් රන් සහතිකයද,
50 - 59 අතර නම් රිදී සහතිකයද,
40 - 49 අතර නම් සහතික මට්ටමක්ද ලබා දේ.

ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ දැනට පවතින ක්‍රමවේදවලින් බැහැරව මෙම පරිසර හිතකාමී හරිත සංකල්ප අනුගමනය කිරීම තිරසර සංවර්ධනයක් කරා යන ගමනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට ඉහල දායකත්වයක් දක්වනු ඇත.මෙම ක්‍රමවේදය අනුව බිහිවන පරිසර හිතකාමී ගොඩනැගිලි සංකල්පය රාජ්‍ය අංශයෙන් ඔබ්බට ගොස් පෞද්ගලික අංශයේ ගොඩනැගිලි සඳහාත් යොදා ගැනීම මෙහි මීළඟ අපේක්ෂාව වේ.

# මානව සම්පත් කළමනාකරණ අංශය නැවුම් අදියරක...

2017 වර්ෂයේ  මුල් කාර්තු දෙක තුළ මානව සම්පත් කළමනාකරණ අංශයේ ප්‍රගතිය සැලකිය යුතු අන්දමින් ඉහළ නංවා ගැනීමට එම අංශය සමත්ව සිටී.

අධිකාරියේ සමස්ථ කළමනාකරණ සේවකයන් පාරදෘශ්‍ය විගණනයකට ලක් කරමින් ඔවුන් අතරින් අදාළ සුදුසුකම් සපුරාලූ සහකාර අධ්‍යක්ෂවරුන් 09 දෙනෙකු නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු වලට සේවයේ උසස් කරමින්ද , නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්  09  දෙනෙකු අධ්‍යක්ෂ තනතුරු දක්වාද, ඒකක ප්‍රධානී තනතුරු 08ක්ද , අධ්‍යක්ෂ වරුන් තිදෙනෙකු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වරුන් ලෙසද මෑතකදී  උසස්වීම් ලබාදෙන ලදි.

අධිකාරියේ විවිධ තනතුරු සඳහා (නීති නිලධාරීන්, ඉඩම් නිලධාරීන්, සැලසුම් නිලධාරීන්, පරිගණක යන්ත්‍ර ක්‍රියාකරු, කම්කරු යනාදී තනතුරු සඳහා) නිලධාරීන් 74 දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කර ඇත. ප්‍රාථමික මට්ටම ශිල්පීය නොවන සේවා ගණයේ සිට කණිෂ්ඨ කළමනාකරණ සේවා ගණය දක්වා වූ  ශ්‍රේණි උසස් වීම් 549 ක් ලබා දීමට කටයුතු කර ඇත.

මෙම තනතුරු  උසස්වීම් වලට සමගාමීව යළි නව අංශයන් දෙකක් ස්ථාපනය කරන ලදුව ඒ මගින් නාගරික සංවර්ධන අධිකාරියේ නාගරික සැලසුම් ප්‍රසම්පාදනය සහ නිර්මාණය කිරීම වේගවත් කිරීමට මෙම අංශ දෙක මගින් සේවය සලසනු ලබයි.

බාහිර බඳවා ගැනීම් 93ක් මගින් දිගු කාලයක් තිස්සේ  ප්‍රධාන කාර්යාලයේ අංශයන්හි පැවති සේවක හිඟය මේ වන විට  මග හැරීමට සමත්ව ඇති අතර, නව බඳවා ගැනීම් ඔස්සේ ආයතනයට පැමිණි සේවකයන් සඳහා පුහුණු පාඨමාලා මේ වන විටත් ආරම්භ කර තිබේ.

### පුහුණු

සහකාර අධ්‍යක්ෂ තනතුරේ සිට නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර දක්වා උසස්වීම් ලද සේවක මහත්ම මහත්මීන් සඳහා පළමු පුහුණු සැසිය කටුකුරුන්ද, මෙම පාඨමාලාව  ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනයට අනුබද්ධ පුහුණු ආයතනය වන වෙරිස් ප්ලෑන්ස් ප්‍රයිවට් ලිමිටඩ් ,කටුකුරුන්දේ දී  හිදී පැවති අතර, එමගින් නව අත්දැකීම් සම්භාරයක් අත්පත් කර ගැනීමට හැකි වූ බව පුහුණු සැසියට සහභාගී වූවන් පැවසූහ.

පරිපාලන නිලධාරීන් සඳහා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ වරුන් සඳහා පවත්වන ලද ක්ෂේත්‍ර පුහුණු  (Out bound Training) නායකත්ව ලක්ෂණ වැඩිදියුණු කිරීම අරභයා මහත් පිටුවහලක් වනු ඇති බව පුහුණුවට සහභාගී වූවන් පවසනු ලැබීය. මෙම පාඨමාලාව ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනයට අනුබද්ධ පුහුණු ආයතනය වන වෙරිස් ප්ලෑන්ස් ප්‍රයිවට් ලිමිටඩ්, කටුකුරුන්දේ දී නොබෝදා පවත්වනු ලැබීය.

තවද, සැලසුම් පොකුරු ක්‍රමය පිළිබඳව 260 දෙනෙකු දැනුවත්  කිරීමේ වැඩසටහනක්ද ඉඩම් අනුබෙදුම් හා ගොඩනැගිලි අයදුම්පත් පෙරසැරි කිරීමේ ක්‍රමවේදය පිළිබඳව ඉහළ කළමනාකාර නිලධාරීන් 51  දෙනෙකු දැනුවත් කිරීමේ වැඩසටහන් 02ක්ද, භූ ගෝලීය සිතියම් කරණය පිළිබඳ නිලධාරීන් 46 දෙනෙකු සඳහා නේවාසික වැඩමුළුවක්ද බලාත්මක නිලධාරීන් හා පරිගණක යන්ත්‍ර ක්‍රියාකරුවන් 178 දෙනෙකු සඳහා වැඩමුළුවක්ද පවත්වා ඇත.

මිලෝදා ආයතනයේ විවිධ පුහුණු වැඩසටහන් සඳහා මුදල් අංශයේ 09 දෙනෙකුද ප්‍රසම්පාදනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් සඳහා අධ්‍යක්ෂවරුන් 08 දෙනෙකු ද සහභාගී කරවන ලදි.

ඉංජිනේරුවන් සඳහා පැවති වැඩමුළු 04ක් සඳහා නිලධාරීන් 24 දෙනෙකු සහභාගී කරවා ඇත.

විදේශ පුහුණු සඳහා නිලධාරීන් 20 දෙනෙකු සහභාගී කරවා ඇත.

# එස්5 සංකල්පය ක්‍රියාත්මක කිරීම.

පෙබරවාරි මාසයේ ආරම්භ කරන ලද එස්5 සංකල්පයේ දැනුවත් කිරීමේ වැඩසටහන්  මේ වන විට ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශ සඳහා පවත්වා ඇති අතර, සෙයිරි වැඩසටහනද සෑම අංශයකම මේ වන විට අවසන් අදියරට පැමිණ තිබේ. පළාත් කාර්යාලයන් අතරින් සබරගමුව පළාත් කාර්යාලයේ එස්5 දැන්වත් කිරීමේ වැඩසටහන් හා සෙයිරි  වැඩසටහන අවසන්  වී ඇත.

අධිකාරියේ  මධ්‍යම කළමනාකරණ තලයේ සේවකයන් සඳහා විදේශ පුහුණු  08ක් සඳහා සේවකයින් 17ක් සහභාගී කරවනු ලැබූ අතර, සැලසුම් පොකුරු ක්‍රමය යටතේ විවිධ පුහුණු වැඩමුළු පවත්වනු ලැබීය.

භාෂා කුසලතාවය ඉහළ නැංවීමේ අරමුණින් නාගරික සංවර්ධන අධිකාරියේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියේ උපදේශක, කිත්සිරි ආනන්ද මහතා විසින් පවත්වනු ලැබූ ඉංග්‍රීසි පාඨමාලාවේ සැසිවාර 24 ජුනි මස 01 වන සතියේ නිමා විය. මෙම ඉංග්‍රීසි භාෂා පුහුණුව වෘත්තීය හා වෘත්තීය නොවන සේවක කණ්ඩායම් ද්විත්වය වෙනුවෙන්  පවත්වනු ලැබූ සාර්ථක පාඨමාලාවක් බව පුහුණු වූවෝ පවසති.

අධිකාරියේ 5S සංකල්පය ක්‍රියාත්මක කිරීම යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශ සඳහා පවත්වා ඇති අතර, සෙයිරි වැඩසටහන්ද සෑම අංශයකම අවසන් කර ඇත. සබරගමුව හා මධ්‍යම පළාත් කාර්යාලයේ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇති අතර, සෙයිරි වැඩසටහන් අවසන් අදියරට පැමිණ තිබේ. මානව සම්පත් කළමනාකරණ අංශයේ මේ වන විට 5S සංකල්පය අවසන් අදියරේ ක්‍රියාත්මක වේ.

## ක්‍රීඩා පුවත්

ප්‍රවීනයන්ගේ මළල ක්‍රීඩා ශ්‍රී ලංකා සංගමය මඟින් 2017 සැප්තැම්බර් මස 24 වන දින සිට 28 වන දින දක්වා චීනයේ පැවැත්වෙන ආසියාතික මළල ක්‍රීඩා උත්සවය සඳහා ලංකාවෙන් ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරාගැනීමේ ක්‍රීඩා උත්සවය 2017 මැයි මස 20 සහ 21 වන  යන දිනවලදී මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනයේදී පැවැත්වීය.  එහිදි නාගරික සංවර්ධන අධිකාරියේ මුදල් අංශයේ සේවය කරන වජිරා ජාගොඩආරච්චි මීටර් 5000 ඇවිදීමේ තරඟයෙන් තුන්වන ස්ථානය සහ ආරක්ෂක අංශයේ ඒ.ජී.සුනිල් මහතා කවපෙත්ත විසිකිරීමේ ඉසව්වෙන් තුන්වන ස්ථානයත් දිනාගන්නා ලදි.

මේ අනුව, ඔවුන් දෙදෙනා ප්‍රවීනයන්ගේ මළල ක්‍රීඩා තරඟාවලියට සහභාගිවීම සඳහා සුදුසුකම් ලබා ඇත.





## නාගරික සංවර්ධන අධිකාරියේ සුභ සාධක සංගමයේ සමාජ සත්කාරය



නාගරික සංවර්ධන අධිකාරියේ සුභ සාධක සංගමය සිය සමාජ මෙහෙවර ප්‍රකට කරමින් ගංවතුරින් හානියට පත්වූ ප්‍රදේශයන්හි සහෝදර ජනතාව උදෙසා වියළි ආහාර, ජල බෝතල්, සෞඛ්‍ය උපකරණ සහ ළමා ඇඳුම් ආදිය පරිත්‍යාග කරන ලදී.

දින තුනක් පුරා මෙම සද්කාර්ය දියත් කරන ලද අතර, ලක්ෂ 30 ක පමණ ද්‍රව්‍යමය ආධාර ජනතාව වෙත පිරිනමන ලදි. මේ සඳහා කාර්යාලයේ සහ බාහිර පාර්ශවයන් විසින් ආධාර ලබාදුන් අතර, ඒවා පුන්‍යානුමෝදනා පූර්වකව භාරගෙන නිසි ආකාරයෙන් විපතට පත් පවුල් අතර බෙදා හරින ලදි.